᾿ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2185/64 - 2020 ජූලි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කඩු/ඉඩම්/03/138/යූඩීඒ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තරය:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 477 ඒ තලංගම උතුර 'බී' ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තලංගම උතුර ගමේ (කඩුවෙල මහනගර සභා සීමාව තුළ) පිහිටි සර්වේජනරාල් විසින් පිළියෙල කර ඇති කො. 9863 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 1, 2, 3 හා 4 න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්. 0.2235 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි හතර (04).

කැබලි අංක 1

ඉඩමේ නම: දොඹගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: –; ප්‍රමාණය: හෙක්. 0.0096.

කැබලි අංක 2

ඉඩමේ නම: දොඹගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 5ක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, ළිං 2ක් සහ වැසිකිලියක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: එන්. ජේ. ඒ. කේ. පී. සේනානායක, පී. ඒ. සී. ඩී. අමරසේකර සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.1279.

කැබලි අංක 3

ඉඩමේ නම: දොඹගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ වැසිකිලියක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: දිනේෂා පෙරේරා සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0800.

කැබලි අංක 4

ඉඩමේ නම: දොඹගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: –; ප්‍රමාණය: හෙක්. 0.0060.

1A - G 32571 - 17 (2020/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.08.26 දින පෙරවරු 10.00 ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2020.08.19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් පෑමට සහාය වන සියළුම ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ඒ. ඩී. වයි. ආනන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2020 ජූලි මස 20 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.